C
377
SEN

# ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ විෂය මාලාව හා කළමනාකරණය පිළිබඳ නව ප්‍රවණතා

( නිදහසින් පසු )

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධියේ අවශ්‍යතා අර්ධ වශයෙන් පූරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයයි

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

__නිබන්ධක:__ ඊ. එල්. ආර්. සෙනෙවිරත්න

නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා අධ්‍යාපන පරි: සේවය- II පන්තිය

සා: පුහුණු ( I පෙළ ) 1965

සා: ශාස්ත්‍රවේදී උපාධි - 1970

ප: උ: අධ්‍යා: ඩිප්: (පූර්ණකාලීන) සම්මාන- 1981

ප: උ: අධ්‍යා: කළ: ඩිප්: සම්මාන - 1990

__උපදේශක:-__

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා අංශාධිපති

ආර්. පී. ලියනගේ මහත්මා.

464715

## සාර සංග්‍රහය

බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ නිවහන වූ ' පන්සල ' ලක් පොළොවේ බුදුදහම පිහිට වූ අවධියේ පටන් ම මූලික අධ්‍යාපන ආයතනයක් වශයෙන් පැවතුණේය. මෙම මූලික අධ්‍යාපන ආයතනයේ උසස් අධ්‍යාපන ආයතනය ලෙස සලකනු ලැබුවේ පිරිවෙන ය. ක්‍රි:පූ: 3 වන සිය වස මැද භාගයේ දී මෙරට ප්‍රතිෂ්ඨාපනය වූ බුදු දහම, මුල් කර ගෙන බිහි වූ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය වරින් වර ඇති වූ ප්‍රවනතා මගින් පෝෂනය වෙමින් විකාශය වූ අතර මෙය ශ්‍රී ලංකා අධ්‍යාපන ඉතිහාසයේ ඉතා වැදගත් ආයතනයකි. මෙලෙස ගැඹුරු පදනමකින් ආරම්භ කරන ලද පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමේ ලා විෂය මාලාව හා කළමනා-කරණය හිමි කර ගනුයේ වැදගත් ස්ථානයකි.

ශ්‍රී ලාංකිකයන්ගේ අධ්‍යාපන ඉතිහාසයේ පදනම ලෙස සැලකිය හැකි මෙම පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ කෙටි වාර්තා, රචනා සහ සඟරා ලිපි, ව්‍යවස්ථා සංග්‍රහ, නිර්දේශ පත්‍ර ආදිය වරින් වර නිකුත් වී ඇතත්, පිරිවෙන් විෂයය මාලාව හා කළමනාකරණය යන අංශයන් පිළිබඳ ගැඹුරු ශාස්ත්‍රීය අධ්‍යයනයක් කිසිවකු විසිනුත් මෙතෙක් කර නොමැත. ඒ නිසා මේ සා විශාල වැදගත් කමක් ඇති පිරිවෙන් අධ්‍යයනයේ අභිවෘද්ධිය සඳහා මෙවැනි අධ්‍යයනයක් කිරීම කාලීන අවශ්‍යතාවක් ලෙස මම අදහස් කළෙමි. විශේෂයෙන් පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු හා අපේක්ෂණ සාක්ෂාත් කිරීමේ අත්‍යවශ්‍ය මෙවලම් ලෙස සැලකෙන විෂය මාලාව හා කළමනාකරණය යන අංශ වැදගත් කොට සලකා මෙම අධ්‍යයනය සඳහා එය මාතෘකා කොට ගතිමි.

පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු ඉටු කිරීමේ ලා විෂය මාලාවක හා විධිමත් කළමනාකරණයක ඇති වැදගත්කම සොයා බැලීමත්, කලින් කළ අවධාරණය වන ශ්‍රේෂ්ට අරමුණු විෂය මාලාවේ හා කළමනාකරණයේ දුබලතා නිසා අපේක්ෂිත මට්ටමට ඉටු කර


PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

ගැනීමට හැකි වේ දැයි සැක සහිත බැවින් පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු ඉටු කිරීමට තුඩු දුන් විෂය මාලාව හා කළමනාකරණය පිළිබඳ ව විස්තරාත්මක ව කරුණු ගවේෂණය කිරීමත් එම කරුණු සෙවීමේ දී අනාවරණය වන ගැටළු සඳහා පිළියම් යෝජනා කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණු ලෙස දැක්විය හැකි ය.

මෙම මාතෘකාව යටතේ කරුණු වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා නිදහසින් පසු දශක 4 ක පමණ කාලයකට සීමා කිරීමට මම අදහස් කළෙමි. විශේෂයෙන් මෙම කාලය තීරණය කළේ පිරිවෙන් කළමනාකරණයට අදාල අණ පනත්, චක්‍රලේඛ නියෝග රාශියක් පසුගිය දශක හතර ඇතුළත නිකුත් වී ඇති බැවිනි.

මේ අධ්‍යයනය සඳහා ඓතිහාසික හා විස්තරාත්මක පර්යේෂණ ක්‍රම ශිල්පය ( HISTORICAL AND DESCRIPTIVE RESEARCH METHODOLOGY ) අනුගමනය කළ අතර, පිරිවෙන් විෂය මාලාවේ හා කළමනාකරණයේ වරින් වර ඇති වූ ප්‍රවණතා හා ප්‍රතිසංස්කරණ ඒ හා සම්බන්ධ වාර්තා, පනත් හා චක්‍රලේඛවලින් උපුටා ගත් කොටස්, ඓතිහාසික හා නූතන සාහිත්‍යය ආදිය මඟින් ලබා ගත් තොරතුරු, සම්මුඛ සාකච්ඡා නිරීක්ෂණ හා ප්‍රශ්නාවලින් පර්යේෂණ උපකරණ ලෙස භාවිතා කර ඇත.

මෙම දත්ත හා තොරතුරු පදනම් කර ගෙන බෞද්ධ යුගයේ බිහි වූ පිරිවෙන් සංකල්පය හඳුනා ගැනීමත්, වරින් වර පිරිවෙන් අධ්‍යාපන විෂය මාලාවේ හා කළමනාකරණයේ ඇති වූ වෙනස්කම් හා නව ප්‍රවණතා විමසුමට ලක් කිරීමත්, හඳුනාගත් සියලු තොරතුරු විස්තරාත්මක පර්යේෂණ ක්‍රම ශිල්පය අනුගමනය කරමින් විග්‍රහ කිරීමත් මෙම අධ්‍යයනයේ දී සිදු කළ අතර එම තොරතුරු ඇසුරින් අනාවරණය කර ගත් ගැටළු සඳහා පිළියම් වශයෙන් යොදා ගත හැකි නව යෝජනා ඉදිරිපත් කිරීමක් මෙම අධ්‍යයනයේ ප්‍රධාන කාර්යයක් වශයෙන් සඳහන් කළ හැකි ය.

මේ අත්දමට සකස් කළ අධ්‍යයනයේ දී රැස් කරන ලද කරුණු සියල්ල පරිච්ඡේද පහක් යටතේ කර ඇත.

පළමුවන පරිච්ඡේදයේ පිරිවෙන් සංකල්පය පැහැදිලි කිරීම හා 1947 දක්වා පිරිවෙන් අධ්‍යාපනයේ පදනම් තොරතුරු සැකෙවින් දක්වා ඇත. බුදු දහම මෙරට ප්‍රතිෂ්ඨාපනය වීමෙන් අනතුරු ව අධ්‍යාපනය බමුණු ශාස්ත්‍රශාලාවලින් ' පන්සල ' වෙත ඇදී ගිය ආකාරයත් එම ' පන්සල ' නම් වූ මූලික අධ්‍යාපනය ලැබූ ස්ථානයේ උසස් අධ්‍යාපනය ලබා දෙන ස්ථානය ' පිරිවෙන ' ලෙස එදා හැඳින්වූ ආකාරයත් මෙම පරිච්ඡේදයේ මුල් කොටසේ දක්වා ඇත.

එසේම පිරිවෙන විශාල භික්ෂු මධ්‍යස්ථානය ලෙස නම් කළ ආකාරයත් පසු-කාලීන ව එය භික්ෂූන්ගේ විද්‍යාස්ථානය ලෙස අර්ථකථනය කළ ආකාරයත් විස්තර කරමින් ' පිරිවෙන ' යන සංකල්පය පිළිබඳ පැහැදිලි විග්‍රහයක් මෙහි දක්වා ඇත. ඉන් අනතුරු ව විෂය මාලාව හා කළමනාකරණය පිළිබඳ ව විශේෂ අවධානයක් දෙමින් අනුරාධපුර යුගයේ පටන් 1947 දක්වා වරින් වර ඇති වූ සංශෝධන සහිත ව පිරිවෙන් අධ්‍යාපනය විකාශය වූ අයුරු විස්තර කරමින් පළමු පරිච්ඡේදය අවසන් කර ඇත.

1947 න් පසු පිරිවෙන් විෂය මාලාවේ සංවර්ධනය පිළිබඳ ව දෙවන පරිච්ඡේදයේ විස්තර සඳහන් වේ. 1959 අගෝස්තු මස 07 වැනි දින අංක 11,828 දරණ ගැසට් නිවේදනය අනුව රජය විසින් සම්මත කරන ලද පිරිවෙන් පිළිබඳ නියෝග සංග්‍රහය, 1979 අංක 64 දරන පිරිවෙන් පනත හා 1980 අංක 1 දරණ පිරිවෙන් නියෝග අනුව වරින් වර පිරිවෙන් අධ්‍යාපනයේ විෂය මාලාවේ හා කළමනාකරණයේ සිදු වූ වෙනස්කම් මෙම පරිච්ඡේදයේ ඇතුළත් කර ඇති අතර මේ මගින් බුද්ධකාලීන ඉතිහාසයේ

සම්ප්‍රදායික විෂය මාලාවක් අනුගමනය කළ පිරිවෙන් අධ්‍යාපනය විවිධ අවස්ථා අනුව සාමාන්‍ය අධ්‍යාපන විෂය මාලාවට අනුරූප වීමට දරා ඇති උත්සාහය දක්වා සංවර්ධනය වී ඇති ආකාරය දෙවෙනි පරිච්ඡේදයේ සවිස්තර ව දක්වා ඇත.

තුන්වන පරිච්ඡේදයේ විස්තර කර ඇත්තේ නිදහසින් පසු විවිධ අවස්ථා අනුව පිරිවෙන් කළමනාකරණය සංවර්ධනය වූ ආකාරය පිළිබඳ ව ය. 1949 රජය විසින් අනුමත කළ අධ්‍යාපන රෙගුලාසිමාලාව, 1959 දී සම්මත කළ ගැසට් නිවේදනය, 1979 දී සම්මත කළ පනත හා 1980 වර්ෂයේ දී පැන වූ පිරිවෙන් නියෝග අනුව වරින් වර පිරිවෙන් කළමනාකරණය හා පරිපාලනය විධිමත් කිරීම සඳහා සිදු කළ සංශෝධන පිළිබඳ ව මෙම පරිච්ඡේදයේ කරුණු ඇතුළත් කර ඇත.

දෙවන හා තුන්වන පරිච්ඡේදවල පිළිවෙලින් විස්තර කළ විෂය මාලාව හා කළමනාකරණය පිළිබඳ තොරතුරු පදනම් කර ගෙන එම ක්ෂේත්‍ර දෙකෙහි වරින් වර ඇති වූ නව ප්‍රවණතා පිළිබඳ ව සතරවන පරිච්ඡේදයේ විස්තර කරයි. තව ද මෙම පරිච්ඡේදයේ විෂය මාලාවට විෂය සමගාමී කටයුතු ඇතුළත් කළ ආකාරයත් සාමාන්‍ය අධ්‍යාපනයේ විධිමත් විෂය මාලාවට සමීප වීමට දරා ඇති උත්සාහයත් පිළිබඳවත් විභාග පරිපාටිය හා පාඨමාලා පිළිබඳ විස්තර හා නව ප්‍රවණතාත් ඇතුළත් කර ඇත. එසේ ම පිරිවෙන් කළමනාකරණය විධිමත් කිරීම සඳහා වරින්වර කරන ලද වෙනස්කම් තුළින් එළි දුටු නව ප්‍රවණතාවන් පිළිබඳ ව ද මෙම පරිච්ඡේදයේ විස්තර කර ඇත.

පස්වන පරිච්ඡේදයේ දක්වා ඇත්තේ පිරිවෙන් විෂය මාලාව හා කළමනාකරණය ආශ්‍රිත ව නිම කරන ලද අධ්‍යයනයේ දී හඳුනා ගත් ගැටළු, එම ගැටළුවලට පිළියම් ලෙස ඉදිරිපත් කරනු ලබන යෝජනා සහ පසු පර්යේෂණයන් සඳහා ඉඟි වශයෙන් පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියේ දී සිදු කළ හැකි අධ්‍යයන ක්ෂේත්‍රයන්

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පිළිබඳ කෙටි හැඳින්වීම යන අන්තර්ගතයන් ය.

අදාල පිරිවෙන් කළමනාකරුවන් සඳහා කළමනාකරණය හා පිරිවෙන් අධ්‍යාපන නීතිය පිළිබඳ ගැඹුරු දැනුමක් නොමැති වීම, විධිමත් අධීක්ෂණ ක්‍රමයක් නොමැති වීම, සම්පත් ඌනතාවය, සංවිධාන ව්‍යුහයක් හෝ කාර්යය පැවරීමේ ක්‍රමවත් රටාවක් නොමැති වීම, කාර්යාල කළමනාකරණය පිළිබඳ ව අවබෝධයක් පිරිවෙන් කළමනාකරුවන්ට නොමැති වීම, අවිනිශ්චිත ශිෂ්‍ය භාවය, ගිහි පැවිදි සිසුන් හා වසර කිහිපයක සිසුන්ට එක් ව එකට ලබා දෙන අධ්‍යාපනය පිරිවෙන් ගුරුවරුන්ගේ වෘත්තීය අස්ථාවරත්වය ආදිය පිළිබඳ හඳුනා ගත් ගැටලු මෙම පරිච්ඡේදයේ විස්තර කර ඇත.

පස්වන පරිච්ඡේදයේ අවසානයේ ද දක්වා ඇති යෝජනා වලට අතිරේක ව මෙම ක්ෂේත්‍රය තුළ පසු පර්යේෂකයන් සඳහා ඉඟි වශයෙන් " පිරවෙන්වල ක්‍රියාත්මක කරන විෂය ඉගැන්වීම් කටයුතුවලට අතිරේක ව, එම අධ්‍යාපනයෙන් අපේක්ෂිත අරමුණුවලට පටහැනි නොවන පරිදි මෙන් ම එම අරමුණු ප්‍රායෝගික ව ඉටු කර ගැනීමට තුඩු දෙන විෂය සමගාමී කටයුතු කවරේ ද යන්න හඳුනා ගැනීමට ත් ඒවා ක්‍රියාත්මක කිරීමේ දී පිරිවෙන් ගුරුවරුන් හා විශේෂයෙන් පරිවේනාධිපතින් වහන්සේලාගේ භූමිකාවන් හඳුනා ගැනීම හා කළමනාකරණ පුහුණු වැඩ සටහන් යෝජනා කිරීම යෝග්‍ය සැළසුම් සකස් කරන ආකාරයත් අනාවරණය කර ගැනීමත් පිළිබඳ ව කරනු ලබන අධ්‍යයනයන්හි අවශ්‍යතාව අවධාරණය කළ හැකි ය.

<u>අධ්‍යයනයේ සීමාවන්:</u>

ශ්‍රී ලංකාව ස්වාධීන රාජ්‍යයක් බවට ප්‍රකාශ කිරීමෙන් අනතුරු ව වරින්වර පිරිවෙන් අධ්‍යාපන විෂය මාලාව හා කළමනාකරණය සම්බන්ධයෙන් සිදු වූ වෙනස්කම් ආශ්‍රිත ව මෙම අධ්‍යයනය නිම කර ඇත. අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් පිරිවෙන් අධ්‍යාපනයේ නව සංශෝධන ඇති කිරීම සඳහා යෝජනා රැස් කරමින් පසුවන මෙවන් සමයක නිමාව දුටු මෙම අධ්‍යයනය 1947 වසරේ සිට 1990 දශකයේ මුල් භාගය දක්වා සිදු වූ විෂය මාලාවේ හා කළමනාකරණයේ වෙනස්කම් පමණක් පාදක කොට ඇත.

\/\/\/\/\/\/\/\/\/\/\/\/\/\/